ජගත් ජේ එදිරිසිංහ

# කටු 4

දිය තලාව සිපගනිමින් හමා එන සුළඟ සිසිල් ය. ගිණිගත් දහවල ගතට දුන් පීඩාව නිවාලන්නට ඒ සුළඟට හැකි ය. නිරාශා වාඩි වී සිටියේ විදුලගේ පිටට පිට තබාගෙන ය. "දියවර" හෝටලයේ ජලාශයට ආසන්න පැත්තේ පිහිටි මේ කෙටි තාප්පය මත පිටට පිට තබා වාඩි වී දිග කල්පනාවක ගැලී සිටීම විදුලට පුරුදු ය. ඔහු කුමන මොහොතක හෝ කතා කරන තෙන් ඔහුට බාධා කිරීමකින් තොරව ඈත දිය තලාව දෙසත් ඒ මත ඇදී යන විවිධාකාර වූ බෝට්ටු දෙසත් ඒවායේ නැගී යන කෙළිලොල් ගැහැනුන් මිනිසුන් දෙසත් බලා සිටීම නිරාශාට ද පුරුදු ය.

බෝට්ටුවක නැගී යන තරුණයකු ඒ දෙස බලා සිටින නිරාශා දෙස බලා අත වනන්නේ සෙල්ලක්කාර කමට ය. ඒ නොදුටුවා සේ අහංකාර මුහුණින් සිටින්නට හැකියාවක් ඇතත් ඇය ද පෙරළා අත වැනුවා ය. එයින් තරුණයා සතුටු වන බව ඇය දනියි.

"අර ප්‍රසිද්ධ නිලිය මට අත වැණුවා.." ඔහු අද සවසට යහළුවන්ට රස කර කියනු ඇතැයි නිරාශා සිතුවා ය. ඇගේ මුවට සිනාවක් නැගෙයි. විදුල ගේ දැහැන බිඳින්නට සිතක් පහළවන්නේ එවිට ම ය. ඇය වැළමිටෙන් ඔහුට අනින්නේ නොරිදෙන්නට ය.

"මොකද බං.." විදුල අසන්නේ හැරී බලන්නටවත් මහන්සියක් නොගනිමින් ය.
"කොල්ලෙක් මට අත වැනුවා.." ඇය කියයි.
"අත නොවැනුවනම් තමයි පුදුමෙ.."
"ඇයි...?"
"මං කොල්ලන්ගෙ හැටි දන්නවනෙ.. ඒකයි.."

නිරාශා කොට තාප්පයෙන් බැස විදුල ඉදිරියේ සිටගත්තා ය.

"දැන් භාවනා කළා ඇති.. යමු කන්ඩ.. මට බඩගිනියි."

ඔහු සුපුරුදු ලෙස සිය දකුණතින් ඇගේ හිස කෙස් අවුල් කළේ ය. ඔහු එසේ කරන්නේ ආදරයක් හිතට ආ වෙලාවට බව ඇය දනියි. " ..අපි තව ටිකක් ඉඳලා යමු.. සෙනග වැඩියි.. දැන්ම ගියොත් අපට නිවී සැනසිල්ලෙ කන්න බැරි වෙයි.."

නිරාශා ඔහු ඉදිරියෙන් වාඩි වී සිය හිස ඔහුගේ පපුවට තබා ගත්තා ය. ".. ඔයා මේ ටිකේ ගොඩක් නිදිමරනවා වැඩියි.. මට දුකත් හිතෙනවා දකිනකොට.." ඈ සෙමින් කීවා ය. ඔහු කිසිවක් නොකියා ඈත ජලාශය දෙස බලා සිටියේ ය.

දිය තලයට සමාන්තරව පිහිනා යමින් සිටින ලිහිණියා ඔහුට පෙනෙයි. ඉතා සීරුවෙන් පියඹමින් සිටින ඌ එක වරම ඊයක වේගයෙන් දිය තුළට වැද මාලුවකු ඩැහැගත්තේ ය. එක් නිමේෂයකදී එක් දිවියක් වෙනුවෙන් තවත් දිවියක් අවසන් කෙරුණි.

"මේ ස්ක්‍රිප්ට් එක ලියල ඉවර කරනකල් මගේ හිතේ බර අඩු වෙන්නෙ නෑ නී.. එතකල් නින්ද යන්නෙ නෑ.." බොහෝ වේලාවකට පසු විදුල කීවේ ය. නිරාශා සිනාසුණා ය.

"ඊළඟට... ඊළඟට ඒක ෂූට් කරනකල් ඔයාට නින්ද යන්නෙ නෑ.. ඊළඟට ඒක එඩිට් කරනකල් ඔයාට නින්ද යන්නෙ නෑ.. ඊළඟට ඒක පෙන්නන කල් ඔයාට නින්ද යන්නෙ නෑ.. ඊළඟට.." ඔහු සිය දකුණතින් ඇගේ කට වැසුවේ ය.

".. වහගන්නයි කිව්වෙ කට.." ඔහු තරවටු කළේ ය. එසේ වුව ද ඇය කියන්නේ ඇත්තක් බව ඔහු දැන සිටියේ ය. නිර්මාණාවේගය ම හිතට බරකි. කිසිදා නිම නොවන බරකි. වදයකි. එකක් පසු පස එකක් ඇදී එන නොනවතින ආවේග වැලෙන් කිසිදා ගැළවීමක් නැති බව ජීවිතය දෙස ආපසු හැරී බලන විට ඔහුට පෙනෙයි. මෙය දුෂ්කර ක්‍රියාවකි. ආත්ම තෘප්තියෙන් ඔබ්බට යමක් නොලැබෙන දුෂ්කර ව්‍යායාමයකි. මේ ව්‍යායාමයේ තේරුමක් තිබේද යන පැනය සැමදාකදී මෙන් ඒ මොහොතේදී ද ඔහු තමාගෙන් ම අසා ගත්තේ ය.

"ඔයා කිව්ව එක හරි නී.." ඔහු ඇගේ හිසට ඔබ්බෙන් ඈත පෙනෙන කිරළ ගාල දෙස බලාගත්වනම පහත් හඬින් කීවේ ය. ".. මේ හැම දෙයක්ම මට බරක් තමයි.. හරියට ගෙවා නිම කරන්න බැරි මොකද්දෝ පවක් මහා බරක් වගේ කර තියාගෙන යනවා.. ඇත්තටම අනික් මිනිස-'සුන්ට නැති .. අපට තියෙන.. මේ උණ මොකද්ද..?"

නිරාශා ඔහුගේ අවුල් හිස කෙස් අතර තම අතැඟිලි රැඳෙව්වා ය.

"ඔයාල වගේ මිනිස්සු මේ ලෝකෙට ගොඩක් ඕනෙ විදුල .... මේ ලෝකෙ මිනිස්සුන්ට තමන් ජීවත් වෙනවයි කියන එක තේරුම් කරල දෙන්න ඔයා වගේ කලාකාරයෝ දහස් ගාණක් ඕනෙ.. ව්‍යාජ කලාව, මුදල් හම්බකරන කලාව, මිනිස්සු රවට්ටන කලාව නොකරන ඔයා වගේ අය මේ සමාජයට ඕනෙ විදුල .." ඈ සෙමින් කීවා ය. ".. ඔයා හැමදාම කලාව කරලා හම්බ කළේ සල්ලි නෙවෙයි.. දේපළ නෙවෙයි.. ඒ වෙනුවට කරදර.. තර්ජන.. ගර්ජන.. දුක්වේදනා.. සමහර මිනිස්සු හිතන්නෙ ඔයාට පිස්සු කියලා.. සමාජ යථාර්ථය ගැන හිතලා හිතලා මොලේ කොලොප්පම් කරගත්ත කලාකාරයෙක්.. අසම්මත මිනිහෙක්" නිරාශා සිනාසුණා ය.

තමන් අන්තිමට සෑදූ "කිණිහිරය" චිත්‍රපටය නිසා විඳින්නට සිදුවූ පීඩාවේ රස්නය තවමත් විදුලට දැනෙයි. පොදුවේ දේශපාලකයන් ගේ දෙබිඩි ජීවිත පිළිබඳ සාකච්ඡා කළ ඒ සිනමා පටය කිසියම් නිශ්චිත දේශපාලකයකු ඉලක්ක කරගනිමින් කළ නිර්මාණයක් නොවී ය. එසේ වුව ද එය තමන් ඉලක්ක කර ගනිමින් තමන්ගේ කීර්තිනාම විනාශ කිරීමට දැරූ උත්සාහයක් යයි බලවත්තු කීපදෙනෙක් ම අනුමාන කළ හ. එය විදුල බලාපොරොත්තු නොවූ දෙයක් නොවී ය. එසේ වුවද එය මරණීය තර්ජන ලැබීමට තරම් දුරට යනු ඇතැයි ඔහු කිසිවිටෙකවත් නොසිතුවේ ය.

සිනමාපටය වෙනුවෙන් මුදල් වියදම් කළ පුද්ගලයා පවා අවසන ඔහුගෙන් ඈත් වූයේ ඒ නිර්මාණය පසුපස හඹා ආ බලවන්තයින්ගේ තර්ජන ගර්ජන විඳදරා ගන්නට නොහැකි වූ නිසා ය.

"මං මුදල් වියදම් කළාට අධ්‍යක්ෂක අතින් නිමැවී තියෙන්නෙ මං බලාපොරොත්තු වුණ චිත්‍රපටය නෙවෙයි.." නිෂ්පාදකවරයා පුවත්පත් හරහා ප්‍රසිද්ධියේ කියා ඇඟ බේරාගත්තේ ය.

විදුල ගේ චිත්‍රපටය පවතින රජයට එරෙහිව ජනතාව කුපිත කරන නිර්මාණයකැයි චෝදනා කරමින් අධිකරණ නියෝගයකින් චිත්‍රපටය තහනම් කරන තෙක්ම දුරකතනයෙන් ලද මරණීය තර්ජන නිම නොවී ය.

තහනම් නියෝගය නිකුත් වුණ දා අධිකරණ භූමියෙන් පිටතට එමින් සිටි විදුල කිසියම් පිරිසක් විසින් පැහැරගනු ලැබුවේ දෙනෝදාහක් බලා සිටිය දී ය.
සිදුවන්නේ කුමක්දැයි තේරුම් ගන්නටවත් අවකාශයක් නොදී ම යම්කිසි වාහනයක ආසන දෙකක් අතර වූ පටු ඉඩ කඩක විදුල දැමූ මැරයන් ඔහුගේ පිට මත පා තබාගෙන සිටියේ නැගිටින්නට කිසිදු ඉඩක් නොතබා ය.

"ඇයි මේ..?" යන්තම් ඉඩක් ලද මොහොතක ඔහු ඇසුවේ ය. පිළිතුරක් වෙනුවට ලැබුණේ මුව හරහා වැදුණ පා පහරකි. ඒ පහරින් තොල පිපිරී ලේ ගලා යනු විදුලට දැනුණි. එකෙක් ඔහුගේ කොණ්ඩයෙන් අල්ලා සෙලෙව්වේ ය. "කට වහගෙන යමං මැරුම්කන්නෙ නැතිව.." විදුලට ඇසුණි. ඒ සමගම වැදුණ තවත් පා පහරකින් ඔහු සිහිසුන් විය.

දින හතරකට පසු පොලිසිය විදුල සොයාගත්තේ පාලු මාවතක සිහිසුන්ව වැතිර සිටියදී ය. ගත වූ දින හතර තුළ තමා අඳුරු ගුහාවක් වැනි තැනක සිරකරගෙන සිටි බවත් වරින් වර පහර දෙනු ලැබූ බවත් විදුලට යන්තම් මතක තිබුණි. ඒ මුලු කාලය පුරාම ඇසුණේ නැවත කිසිවිටෙක විරෝධාකල්ප සහිත සිනමා නිර්මාණ නොකළ යුතු ය යන තර්ජනය ම පමණකි. තර්ජනය කළේ කවුදැයි විදුලට නිශ්චිත නැති නමුත් වරින් වර ඇසුණ කර්කශ තර්ජනාත්මක වදන් නම් ගලේ කෙටුවා සේ ඔහුගේ මතකයේ රැඳී තිබුණි.

"අපිට උඹව මරන්න පුලුවන්.. ඒකට අපට කිසිම බාධාවක් නැහැ.. එහෙම නොකරන්නෙ උඹ වගේ දක්ෂයෙක් මරන එක අපරාධයක් නිසයි.. මතක තියාගනින් අපි දෙවෙනි අවස්ථාවක් උඹට දෙන්නෙ නැහැ.."

"උඹට චිත්‍රපටි හදන්ඩම ඕනෙ නං ලස්සන කෙල්ලෙක්



කොල්ලෙක් දාල සින්දු ටිකක් කාරිය දාල හොඳ ලව් ස්ටෝරිස් හදපං.. චිත්‍රපටි හදන අනිත් හැමෝටම එහෙම කරන්න පුලුවන් නම් උඹට විතරක් බැරි මොකද..? තමුන්ට අදාල නැති දේවල් ගැන කතා හදන්නෙ නැතිව.. තමුන්ට හැප්පෙන්ඩ බැරි මිනිස්සු එක්ක හැප්පෙන්නෙ නැතිව ඉන්ඩ ඉගෙන ගනිං.. එහෙම ඉන්ඩම බැරි නං ඉතින් ඒකට බේත් අපි ළඟ තියෙනවා.."

කිසිවකුට නොකීව ද, හෘදය ශාක්ෂියට එකඟව කරන නිර්මාණයක් හා ජීවිතය යන දෙකින් වඩා වටින්නේ කුමන එක දැයි යන පැනය විදුල නිතරම තමාගෙන් ම අසා ගනියි. සිය නිර්මාණ නිසා ජීවිතය පූජා කළ මිනිසුන් ගැහුණුන් ගැන ඕනෑ තරම් ඔහු අධ්‍යයනය කර ඇත. ඈත අතීතයේදීත් මෑත වර්තමානයේදීත් තම නිර්මාණ වලට අවංක වීමේ පාපයට දිවියෙන් වන්දි ගෙවූ දහසක් නිර්මාණකරුවන් පිළිබඳව ඉතිහාසයේ රන් අකුරින් ලියැවී ඇති බව සැබෑවකි. ජීවිතය හා නිර්මාණය තරාදියක දමා කිරා බැලූ විට වඩා බර නිර්මාණය බව ඇදහුවද ඒ ඇදහීම පිළිබඳ සැක සාංකා වරින් වර විදුලගේ සිතේ ඇතිවෙයි. එසේ සෙළවෙන සිත එක්තැන් කර නිර්මාණය කෙරෙහිම එල්ල කර තබා ගන්නට කොයිතරම් වෙහෙසක් දරන්නට තමාට සිදුවන්නේද යන්න කිසිදා කිසිවකුට නොකියන රහසක් ලෙස විදුලගේ සිත තුළම තැන්පත්ව ඇත.

"මොනාද කල්පනා කරන්නෙ..?" නිරාශා සෙමින් අසයි.
".. හුඟක් දුර නේද හිටියෙ..?"
විදුල සිනාසෙයි.
"අපි යමු කෑම කන්න.."

000000

"මං හෙට ගෙදර යනවා.." මදාරා කීවා ය. ඇගේ සුන්දර මන්දස්මිතය විදුල ගේ සිතේ ඇති කළේ පහන් හැඟීමකි. ".. මට කළ උදව් වලට සර්ලට පින්.."

විදුල නැගිට ගොස් කාර්යාල කාමරයේ කෙළවරක තිබූ වතුර පෙරණයෙන් වතුර වීදුරුවක් පුරවා ගත්තේ ය. ඔහු වීදුරුව අතේ ඇතිවම ජනේලයෙන් පිටත බොහෝ වේලාවක් බලා සිටියේ ය. ඈත තණ පිටියේ දරුවන් පිරිසක් යම්කිසි ක්‍රීඩාවක නිරතව සිටිනු ඔහු ට පෙනෙයි. ගහ කොළ පවා දවාලන දහවල දැඩි හිරු රශ්මිය ඔවුනට නොදැනෙනා සේ ය.

"දැන් ජීවිතේ අලුතින් පටන් ගන්න මට ශක්තිය තියෙනවා.." මදාරා ගේ කටහඬ ඔහුට ඇසුණි. ඔහු හැරී ඇය දෙස බැලුවේ ය.

"ඒ ශක්තිය හැමදාම ඔයා ළඟ තිබුණා.. ඔයා ඒක තේරුම් අරගෙන හිටියෙ නැති එක විතරයි.." ඔහු කීවේ ය. මදාරා කල්පනාවකට වැටෙනු ඔහු දුටුවේ ය.

"ඒක ඇත්ත වෙන්න ඇති.." ටික වේලාවකට පසු ඈ කීවා ය.

"මට ඔයාව ආයෙම හමුවෙන්න ඕනෙ.. " විදුල කීවේ ය.

"මට ඔයාව ආයෙම හමුවෙන්න ඕනෙ.. " තිසර සූරියබණ්ඩාර ද ඒ වචන ම එසේම කියූ දවස මදාරාට මතක ය. ඒ වචන තිසර සූරියබණ්ඩාර කීවේ සරසවියේ පුස්තකාලයේ පටු කොරිඩෝවේ දී ය.

"ආයෙම...?? මොකට ද..?" මදාරා ඇසුවේ වටපිට බලන අතර ඉතා පහත් හඬින් ය. තිසර සූරියබණ්ඩාර ඉල්ලා සිටි ගෙවීම කර අවසන් ය. නැවත හමුවීමේ ඉල්ලීම අනවශ්‍ය ඉල්ලීමකි.

තමාත් සූරිය බණ්ඩාරත් ඈඳා කටකතාවක් මේ වන විටත් සරසවිය පුරා පැතිරෙමින් තිබෙන බව ඈ දැන සිටියා ය. එවන් කට කතාවක් පැතිරෙමින් තිබෙන බව ඇයට හෙළිදරව් කළ මොහොතේ අසංග ගේ නිතරම රතුව තිබෙන ඇස් ගිණිගත් කළෙක මෙන් දිදුලනු ඇයට පෙනුණි.

"ඒ කතාව ඇත්තද කියලා මං ඔයාගෙන් අහන්නෙ නෑ.. මොකද මං ඒක විශ්වාස කරන්නෙ නැති නිසා.." අසංග ගිණියම් ඇසින් මදාරා දෙස බලාගත්වන ම කීවේ ය. මදාරා කිසිවක් නොකියා ඔහුගේ රතු පැහැ ඇස් දෙස ම බලා සිටියා ය. ".. ඒත් මේ කතාව ඇහෙනකොට මගේ හිතට එන තරහ කියන්න බැරි තරම්.. දෙයියන්ගෙ නාමෙන් මේ අන්තිම මාස දෙකේ කල්පනාවෙන් වැඩ